# නවීකරණය වන සමාජයේ සාහිත්‍යකරුවාගේ කාර්යභාර්ය කුමක්ද?

මහාචාර්ය දයා අමරසේකර

## නවීකරණය වන සමාජයේ සාහිත්‍යකරුවාගේ කාර්යභාරය කුමක් ද?

සමාජය විනිවිද දැකීම නැතහොත් සියුම් ලෙස අවබෝධ කරගැනීම යනු අතිශය සූක්ෂ්ම සංවේදී කාරණයකි. අප නොමඟ යවන සාවද්‍ය සංසිද්ධීන් නිරවද්‍ය සත්‍ය කාරණා ලෙස පෙනී යාම මෙහි දී වෙසසින් ම සඳහන් කළ යුත්තකි. පෙනෙන දෙය තුළත් නොපෙනෙන හඳුනාගත නොහැකි ප්‍රපංචයනුත් අතර ඇත්තේ අහසට පොළොව මෙන් ඉතාම දුර සම්බන්ධතාවක් බව පැහැදිලි ය. මෙම සංකීර්ණ සමාජ රටාව තේරුම් ගැනීමට උපකාරී වන අසිරිමත් දැනුම් වේදයකි, සාහිත්‍යය. එහිදී සාහිත්‍යය පැති ගණනාවකින් අපට උපකාරී වේ. එක් අතකට සාහිත්‍යකරුවා කරන්නේ සමාජය සමඟ සංවාදයකි. එම සංවාදයේ දී පුද්ගලයන් තේරුම්ගැනීම මෙන් ම ඔවුන් නිශ්චිත අරමුණක් වෙනුවෙන් හැඩගැස්වීමට ද සාහිත්‍යයට හැකි වේ. අනෙක් අතට එම සංවාදයේ දී කුමන හෝ සමාජ චලිතතාවක් හඳුනාගත හැකිවීම ද වැදගත් වේ. පුද්ගලයාගේ ආකල්ප හෝ සමාජයේ පවතින සංස්ථාවන් යන දෙඅංශයේ ම දැකිය හැකි මේ චලිතතාව නැත්නම් මේ විපරිණාමය පෙරළා මිනිස් ජීවිතවලට බලපාන්නේ කෙසේ ද යන කරුණ සාහිත්‍යකරුවා අතින් සූක්ෂ්මව විවරණය වන්නක් බව සත්‍යයකි. සාහිත්‍යය හා මානව සමාජය අතර ඇති අවියෝජනීය සම්බන්ධතාව මානව ජීවිතයේ ආරම්භයේ සිට ම පැහැදිලි කරගත හැකි වේ. බිලිඳෙකු වැඩි වර්ධනය වන්නේ මවකගේ ලයාන්විත ගීයක් රසවිඳිමිනි. එතැන් පටන් මරණය දක්වා ම අපට මුහුණ දීමට තිබෙන සෑම සිදුවීමක් ම සමඟ බැඳුණු සාහිත්‍යයක් මිනිසා සන්තකව පවතින බව සත්‍යයකි. කිසිදු වර්ගීකරණයකින් තොරව සෑම මිනිසෙක් ම සාහිත්‍යයට ආසක්ත වන්නේ, ආදරය කරන්නේ මෙසේ සාහිත්‍යයේ පවත්නා සර්වව්‍යාපී ගුණය නිසා ය. මෙලෙස සාහිත්‍යය වචනාර්ථයෙන් ම සමාජීය නිෂ්පාදිතයකි. මෙහි දී ලේඛකයාත්, කෘතියත්, පාඨකයාත් සමාජ පරිස්ථිතියත් අතර පවත්නා අන්තර් සම්බන්ධය හෙවත් සාහිත්‍ය සන්නිවේදනය වැදගත් ය. රෝලන්ඩ් බාත්ගේ ආකල්පය වූයේ පාඨකයාගේ පුනරුත්පත්තිය සමඟ කතුවරයාගේ මරණය සිදු වී ඇති බව ය. ඉන් ඔහු අදහස් කළේ පාඨකයා සන්නිවේදන කාර්යභාර්ය කිරීමත් සමඟ කතුවරයාට සාහිත්‍ය කෘතියක අර්ථය පාලනය කිරීමට ඇති බලය අඩු බව ය. මිචෙල් ෆූකෝ කියා සිටියේ සාහිත්‍යකරුවා විවිධ ආර්ථික, සාමාජික, සංස්කෘතික දෘෂ්ටිවාදී සන්දර්භ තුළ ක්‍රියාත්මක වන බවත් එනිසා ඔහුට අසීමිත බලයක් නැති බවත් ය.[1]

සාහිත්‍යය හා සමාජය අතර පවතින මෙම අවියෝජනීය සම්බන්ධතාව විග්‍රහාත්මකව විමසීමේ දී එහි මානව විද්‍යාත්මක මූලයන් කීපයක් ද ඒ සමඟ හඳුනාගත හැකි වේ. සාහිත්‍ය නිර්මාණකරුවා මිනිසා වීමත්, මිනිසා සාමාජික සත්වයෙකු වීමත් එහිලා මූලික කරුණකි. විවිධ සමාජවල විවිධ සාමාජික චර්යා ඒ හා සම්බන්ධ ජනවහර හා සනාචාරයන්හි විශේෂතා හා විවිධතා ඇත ද සෑම සාහිත්‍ය කෘතියක ම පාහේ සෑම සමාජයකට ම පොදු ධර්මතා පවතින බව කිව යුතුය. එක් සමාජයක් තුළ නිර්මිත සාහිත්‍ය නිර්මාණයක් තවත් සමාජයක

[1] Laurenson Diana, Allan Swingwood, *The Sociology of Literature,* Paladin, London, 1972.

රසිකයෙකුට රසවිඳිය හැක්කේ මෙම පොදු ධර්මතාවන් පදනම් කොටගෙන ය.[2] අනෙක් අතට නිර්මාණාත්මක කලාකරුවෙකුට ඔහු ජීවත් වන සමාජයක හෝ දේශයක පමණක් සීමා වීම ද කළ නොහැකි ය. එයට හේතුව එම ලේඛකයන්ගේ කෘති දේශසීමා, සංස්කෘතික සීමා බිඳගෙන විශ්ව සාධාරණ තත්ත්වයක පත්ව තිබීම යි.

සාහිත්‍යය හා සමාජය අතර උක්ත අවියෝජනීය බැඳීම නූතන තාක්‍ෂණය හා විද්‍යාත්මක ආවිෂ්කරණ මඟින් සවිමත් තත්ත්වයට පත් කිරීම ද මේ සමඟ ම අවධාරණය කළ යුත්තකි. නූතන යුගයේ දැකිය හැකි තාක්‍ෂණික හා විද්‍යාත්මක ප්‍රගතිය නිසා ලෝකය පෙරට වඩා කුඩා වී ඇත. අප එය හඳුනාගන්නේ විශ්ව ගම්මානයක ස්වරූපයෙනි. මෙහි ප්‍රතිඵලය සාහිත්‍යයට ලැබී ඇත්තේ කෙසේ ද? සාහිත්‍ය ක්‍ෂේත්‍රය තුළත් වඩාත් විග්‍රහාත්මක විශ්ව සාධාරණ සංස්කෘතික රටා විද්‍යමාන වීමෙනි.[3] කිසියම් සංස්කෘතියක බාහිර ස්වරූපය තවත් සංස්කෘතියකින් වෙනස් විය හැකි වුව ද එහි අභ්‍යන්තරික ලක්‍ෂණයන්හි සමානතාවන් දක්නට ලැබේ. එනිසා තම පැවැත්ම සුරක්‍ෂිත කරගැනීමට නම් පොදුවේ මානව පරපුරේ සුබසිද්ධිය පිළිබඳව අවධානය යොමු කළ යුතුය යන තැනට නූතන මිනිසා පත්ව ඇත. සාහිත්‍යකරුවා මෙම ගුණය නූතනයේ කේන්ද්‍රීය සංරචකයක් බවට පත් කරගෙන ඇත. ඒ අර්ථයෙන් ඉහත සාකච්ඡා කළ ආකාරයට සාහිත්‍යකරුවාගේ නිර්මාණය සමාජ සංවිධානයේ ප්‍රතිබිම්බයක් බඳු වූවකි.

සාහිත්‍යය යනු මිනිස් කණ්ඩායම් තුළ පවත්නා අන්තර් සම්බන්ධතා පිළිබඳව පවත්නා සංකේතයක් ලෙස හඳුනාගත හැකිය. මිනිස් ජීවිතයන් සමාජ පුද්ගලයන් පිළිබඳ සංකේතයකි. මෙහි ජීවිතය යන පදය තුළ ආධ්‍යාත්මික සදාචාරාත්මක සහ ජීවිතාවබෝධය යන කරුණු ඇතුළත් වේ. මේ සෑම සියලු දෙයක ම එකමුතුවෙනි, මිනිස් ජීවිතයටත්, සාහිත්‍යයටත්, විශේෂ ස්වරූපයක් ලබා දෙන්නේ. මෙම කරුණ ඩබ්ලිව්. එච්. හඩ්සන් නම් ලේඛකයා පැහැදිලි කරන්නේ මෙසේ ය.

"සාහිත්‍යය යනු මිනිසුන් ජීවිතයෙන් දුටු දේ ගැබ් වූ වැදගත් වාර්තාවකි. ඔවුන් ජීවිතයෙන් අත්දුටු දේ, ඒ පිළිබඳව ඔවුන් සිතූ දේ, සහ එහි නොයෙක් අංගයන්ගෙන් අත්විඳි දේ පැහැදිලි කිරීම මඟින් අප තුළ හදිසි හා චිරස්ථායී අවශ්‍යතාවක් ඇති කරවයි. සාහිත්‍යය මූලික වශයෙන් භාෂාව මාධ්‍යය කරගෙන ජීවිතය ගැන කෙරෙන ප්‍රකාශයකි."[4]

මෙයින් යළි යළිත් පැහැදිලි වන සත්‍යය වන්නේ සාහිත්‍යය මිනිස් හැඟීම් හා අදහස් මූල ද්‍රව්‍යය කරගත් සමාජීය නිෂ්පාදිතයක් බව ය. එම හැඟීම සහ අදහස් හුදු කාල්පනික තත්ත්වයෙන් මිදී දේශ සීමා ඉන්මවා විහිදුණු තත්ත්වයට රැගෙන යන්නේ සාහිත්‍යයේ පවතින මෙම සමාජීය ගුණයයි. ජී. සොරෝකින් නම් සමාජ විද්‍යාඥයා සාහිත්‍යය වර්ගීකරණය කොට ඇත්තේ මෙසේ ය.

---

[2] පල්ලියගුරු චන්ද්‍රසිරි, *සාහිත්‍යය සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්*, ගොඩගේ ප්‍රකාශන, කොළඹ.
[3] Lowenthal, Leo, *Litreature, Popular Culture and Society*, A Spectruam Book Prenticehall,1961.
[4] Haudson, W. H., *An Introduction to Study of Litreature*, London, 1972.

1. සාංකල්පනික හා සංවේදනශීලී (Ideational and Sensate)
2. වක්‍රෝක්තිමය සහ සංකේතික (Allegoric and Symbolic)
3. යථාර්ථවාදී (Realistic)
4. ස්වභාවවාදී (Naturalistic)
5. ආගමික (Religious)
6. උපහාසාත්මක (Satirical)
7. ලෞකික (Seccular)
8. නාට්‍යමය (Theatrical)[5]

මෙම සාහිත්‍යයික වර්ගීකරණය මගින් පෙනී යන්නේ එම වර්ග කිරීම එක එල්ලේ ම පවත්නා සමාජයේ සමාජ හා සංස්කෘතික රටාව සමඟ දක්වන සම්බන්ධතාවයි. මේ නිසා ම සාහිත්‍යය එක්තරා ආකාරයක සමාජය පිළිබඳ විද්‍යාවකි. සාහිත්‍යය පෝෂණය වන්නේ සමාජයේ පවතින පුද්ගල හා නිෂ්පුද්ගල බලවේගයන් මගින් නිසා කිසියම් යුගයකට අයත් වන නිර්මාණකරුවන් එම යුගයේ සංස්කෘතික නිෂ්පාදන ලෙස ද සැලකිය හැකිය. ඩබ්ලිව්. එච්. හඩ්සන් පැහැදිලි කළ ආකාරයට ඒ නිසා ම සාහිත්‍යය නිර්මාණය පසුපස ඇති මහා ආවේග කරුණු හතරක් යටතේ හඳුනාගත හැකි ය.[6]

1. ආත්ම ප්‍රකාශනයට අප තුළ ඇති බලවත් කැමැත්ත
2. පුද්ගලයන් හා ඔවුන්ගේ කාර්යයන් පිළිබඳව අප තුළ ඇති ඇල්ම
3. අප ජීවත් වන ලෝකයේ යථාර්ථවාදී ස්වභාවය දැනගැනීමට අප තුළ කැමැත්ත
4. ආකෘතිය පිළිබඳව අප තුළ ඇති කැමැත්ත වශයෙනි.

**සාහිත්‍යය කලා මාධ්‍යයක් ලෙස සමාජය සමඟ පවතින බැඳීම**

කලාව ලෙස පොදුවේ හඳුන්වන දැනුම්වේදය එක්තරා ආකාරයක මානව ක්‍රියාකාරකමකි. අනෙකුත් මානව ක්‍රියාකාරකම් හා සසඳනවිට කලාවේ අනන්‍යතාව වන්නේ එහි මූලික අරමුණ ආස්වාදය වීමයි. මෙසේ කලාවේ මූලික අරමුණ මිනිසාට ආස්වාදය ලබාදීම වුව ද මිනිසාගේ අනිකුත් ක්‍රියාකාරකම් කෙරෙහි කලාවේ බලපෑම් පිළිබඳව ඈත අතීතයේ සිටම කලාකරුවන්ගේ විචාරකයන්ගේ මෙන් ම දාර්ශනිකයන්ගේ ද අවධානයට යොමු වූ බැව් පෙනේ. ග්‍රීක දාර්ශනිකයෙකු හා කවියෙකු වූ ප්ලේටෝ තමාගේ *ජනරජය*, ග්‍රන්ථයෙන් මේ බව සාකච්ඡා කොට ඇත. කලාවෙන්, විශේෂයෙන් කාව්‍යයෙන් හා

[5] Sorokin, P, *Social and Cultural Dynamic*, London. 1957.
[6] මෙම කරුණු පිළිබඳව විස්තරාත්මක අවබෝධය සඳහා බලන්න. *සාහිත්‍යය සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්.*

නාට්‍යයෙන් සමාජයට වන යහපත පිළිගන්නා ප්ලේටෝ එයින් සමාජයට විය හැකි හානිය නිසා තම පරමාදර්ශී ජනරජයෙන් කාව්‍යය නෙරපා හැරිය යුතු යැයි යෝජනා කොට ඇත. මෙහි දී වැදගත් වන්නේ වර්තමානයේ දී ප්ලේටෝගේ මතය පිළිගත හැකි ද නැද්ද යන්නට වඩා කලාවට රටක සමාජ දේශපාලන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් කළහැකි ප්‍රමාණය පිළිබඳ ඔහුගේ නිරීක්ෂණයයි. ක්‍රි. පූ. 03 වන සියවස හා ක්‍රි. ව. 03 වන සියවස අවධියේ ඉන්දියාවේ විසූ භරත මුනිවරයා විසින් රචනා කරන ලදැයි සැලකෙන "*නාට්‍ය ශාස්ත්‍ර*" ග්‍රන්ථයේ නාට්‍යය කලාවේ ආරම්භය පිළිබඳ පුවතින් ද හෙළි වන්නේ නාට්‍යය වැනි කලාවක ආස්වාද ජනනයේ මෙන් ම සමාජය කෙරෙහි බලපෑමේ හැකියාව පිළිබඳ විචාරකයන් තුළ වූ විශ්වාසයයි. එම වෘත්තාන්තය අනුව නාට්‍ය කලාවෙන් අපේක්ෂා කරන ලද්දේ කාමයේ හා ලෝභයේ වසඟයට ගිය ලෝකය අශ්ශීල ගති පැවතුමෙන් යුතුව ඊර්ෂ්‍යා ක්‍රෝධ ආදියෙන් මුළාව දුක සැප මුසුව පවතිද්දී ඒවායින් මිදීමේ හැකියාව ලබාදෙන ශ්‍රව්‍ය දෘශ්‍ය ගෝචර වූ විනෝද ක්‍රීඩාවක් සම්පාදනය කොට දීම ය. කලාවේ ඇති ආස්වාද ජනක හැකියාව සහ සමාජය කෙරෙහි බලපෑමේ හැකියාව යන දෙපාර්ශ්වය කෙරෙහි ම කලාකරුවන්ගේ හා කලා විචාරකයන්ගේ පමණක් නොව දාර්ශනිකයන්ගේ, ආගමික නායකයන්ගේ මෙන් ම දේශපාලන නායකයින්ගේ අවධානය ඉතිහාසය පුරා යොමු වී ඇත. පොදුවේ සලකතොත් සාහිත්‍යයේ කාර්යභාර්ය පිළිබඳ මූලික මත දෙකක් ප්‍රචලිතව පවතින බව පෙනී යයි. ඉන් පළමුවැන්න නම් මිනිසා විසින් තම දෛනික ජීවිතයේ විඳිනු ලබන දුක්ඛ දෝමනස්සයන් අමතක කර ඔහු එහා තලයකට රැගෙන යාම ය. මෙම දෘෂ්ටිය සැලකෙන්නේ සාහිත්‍යයේ විඥානවාදය ලෙස ය. එයට අනුව සාහිත්‍යයේ කාර්යභාර්ය විය යුත්තේ ඔවුන්ගේ අදහස් පෝෂණය කිරීමයි. මෙයට ප්‍රතිවිරුද්ධ අදහස යථාර්ථවාදය ලෙස සැලකේ. යථාර්ථවාදය හුවා දක්වන ලේඛකයන් පවසන්නේ ජනතාවගේ යථාර්ථවාදී ජීවිතයේ ප්‍රකාශනය මත සාහිත්‍යය ගොඩනැංවිය යුතු බව යි.[7]

## නවීකරණය වන සමාජය එහි ව්‍යූහාත්මක හා සාර්ව ස්වරූපය[8]

නූතන සමාජය තුළ දැකිය හැකි සමාජ වෙනසෙහි පුළුල් ස්වරූපය නවීකරණ ක්‍රියාවලිය ලෙස හඳුනාගත හැකිය. එහි දී සමාජ ජීවිතය තුළට එක එල්ලේ ම බලපෑ ප්‍රධානතම සංරචකයන් කිහිපයක් ඇත. ඉන් ප්‍රධාන වනුයේ නව තාක්ෂණයේ බලපෑම මත සිදු වූ යාන්ත්‍රීකරණ ක්‍රියාවලියි. සන්නිවේදනය හරහා සමාජ මාධ්‍යයන්ගේ සිට විවිධ තලයන් ඔස්සේ පැතිර ගිය ක්‍රියාවලියක් ලෙස මෙය හඳුනාගත හැකිය. පුද්ගලයන් අතර සිදුවන සමාජ සබඳතා ජාලයට මෙම සමාජ මාධ්‍යයන් මඟින් හා අවශේෂ යාන්ත්‍රික ක්‍රියාවලිය ඔස්සේ සැලකිය යුතු බලපෑමක් සිදු වී ඇත. නව සංකල්පීය හා තාක්ෂණික ක්‍රමය මත

---

[7] ප්‍රනාන්දු මයිකල්, *කලාකරුවාගේ වගකීම කුමක්ද?* - වීමංසා සාහිත්‍යය සංග්‍රහය, ලංකාදීප, 2015. 07. 07.

[8] නූතන ශ්‍රී ලංකාවේ නවීකරණයෙහි සමාජ බලපෑම් තේරුම් ගැනීමට බලන්න.

"*ෆේස් බුක් අපේ රටේ නිර්මාණය කරන්නෙන් හදවත් නැති ලැප්ටොප් සමාජයක්*" - දයා අමරසේකර, ඉරිදා දිවයින විද්වත් හමුව, 2014.03.02.

"*දරුවන් මරණ රුපියල් සත සමාජයක්*" - දයා අමරසේකර, ඉරිදා දිවයින විද්වත් හමුව, 2014.09.07.

"*නූතන සමාජයට සාහිත්‍යයේ අවශ්‍යතාව*" දයා අමරසේකර, වීමංසා සාහිත්‍යය ප්‍රදීප විශේෂ අතිරේකය, 2013.

පදනම්ව නිර්මාණය කරගත්, අන්තර්ජාලය මූලික කරගත් යෙදවුම් කාණ්ඩයක් වන මේ සමාජ මාධ්‍යයන් මඟින් පුද්ගලයන් තමන්ගේ අදහස් දර්ශනයන් අත්දැකීම් හා එකිනෙකාගේ ආකල්පයන් බෙදා ගැනීම ඔන් ලයින් තාක්‍ෂණය හා බැඳී සිටීම විශේෂත්වයකි. පුද්ගලයාගේ සමාජ අන්තර්ක්‍රියා මූලික කරගත් සමාජ අන්තර් සබඳතා රටාවට මෙයින් නවීනත්වයක් ලැබී ඇත. ඒ සමඟ එයට පදනම් වූ ආත්මීය අගනාකම් හා ළැදියාවන් අසංවේදීව යටපත් වී ඇත. මෙරටේ 2013 අවසානය වන විට මුළු ජනගහනයෙන් අන්තර්ජාලය භාවිත කරන පිරිස 20%ක් පමණ සුළු පිරිසක් වුවත් එම පිරිසෙන් 50% ආසන්න ප්‍රමාණයක් Facebook පාවිච්චි කරන බවත් ඉන් 32%ක් ම අවු. 18-27 වයස් කාණ්ඩයේ අය වීමත් විශේෂ සිද්ධියකි. මෙයට අමතරව මානව සබඳතා රටාව සියුම්ව පිරික්සීමේ දී මිනිසා සෙල්ෆෝනයේ සිට උපකරණ රාශියක් හරහා විවිධ අවශ්‍යතා සඳහා දෛනිකව විශාල ලෙස අජීවී යන්ත්‍ර මත රඳා පවතින බව පෙනේ. ඒවායේ සාර්ථක අසාර්ථක බව නිර්ණය කිරීමට වඩා වැදගත් වන්නේ මානව සබඳතා යටපත් කොට නැගී සිටින භාණ්ඩ පිරිවරා ගත් කෘත්‍රිම සමාජ සබඳතාවලියකි. මෙහිදී මේරි ඩග්ලස් හා බැරන් ඉෂවුඩ් යන මානව විද්‍යාඥවරිය හා අර්ථ ශාස්ත්‍රඥයා විසින් රචිත *"භාණ්ඩමය සමාජය - පරිභෝගය පිළිබඳ මානව විද්‍යාවක් කරා"* යන කෘතිය පිළිබඳ සඳහන් කිරීම වැදගත් ය. මේ අය පෙන්වා දෙන්නේ ද්‍රව්‍යමය වස්තූන්ගේ වටිනාකම ඒවායේ ආර්ථික අංශයේ මත පමණක් නොව ඒවායේ අන්තර්ගත සමාජ අර්ථ සංකේතාත්මක අගය, සන්නිවේදන ක්‍රියාදාමය මත රඳා පවතින බවයි. ඔවුන්ට අනුව ද්‍රව්‍යමය වස්තූන්ගේ පාරිභාරික වටිනාකම් හැමවිට නියත සංස්කෘතික පරිස්ථිතියක් තුළින් බිහි වේ.

මෙලෙස නූතන මිනිසා නවීකරණය වන සමාජය තුළ මුහුණ දී ඇති සංස්කෘතික ගැටලු

**පවුල**

1. පවුලේ බිඳ වැටීම
2. බිඳුණු පවුල් නිර්මාණය
3. දෙමාපියන් හා දරුවන් අතර පරතරයක් නිර්මාණය වීම

**සමාජය**

1. භාණ්ඩ මූලික කරගත් කුටුම්බ සංස්ථාපනය
2. සංවේදී පුද්ගල සබඳතා වෙනස්වීම
3. ධනය සහ බලය ගරුත්ව සංකේතයන් ලෙස සමාජ ජීවිතය පාලනය කිරීම
4. තියුණු අධ්‍යාපන තරගය හා බැඳුණු දැනුම පමණක් කේන්ද්‍ර කරගත් පෞද්ගලික අභිලාෂ ආශ්‍රයෙන් හඳුනාගත හැකිය.

නූතන සමාජ ප්‍රවාහය තුළ නවීකරණය විසින් හඳුන්වා දෙනු ලැබූ නව සමාජ ධාරාවන් විසින් අප වෙත යොමු කර ඇති ප්‍රධාන ප්‍රශ්න දෙකකි.

1. නූතන අධ්‍යාපනයෙන් අප දැනුම සොයා යන ක්‍රියාවලිය නතර වන්නේ කොතනින් ද? එම දැනුම හුදු දැනුම සඳහා මිස අපගේ පෞරුෂ සංවර්ධනය සඳහා යොදාගත හැකි ද?
2. නූතන නවීකරණ සමාජය තුළ උද්දීපනය කර පෙන්වන සතුට සොයා සැවොම දිව යති. එහෙත් ඉන් ලැබෙන්නේ කුමක් ද? සතුට හා තෘප්තිය දෙකේ වෙනස හඳුනාගන්නට නව සමාජයට හැකිවේවි ද?

යුද්ධයෙන් බරපතළ ලෙස ගිලන් වූ සමාජය නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ දී මෙම සංස්කෘතික කාරණා සමාජ පූර්ව අවශ්‍යතා ලෙස අවධානයට ලක් කිරීම වැදගත් ය. එසේ නොවුණ තැන මෙබඳු යාන්ත්‍රික සමාජයක වෙසෙන නූතන මිනිසා සමාජානුයෝගී නොවූ කෘත්‍රිම මිනිසෙකුගේ තත්ත්වයට වැටේ. එම මිනිසා ප්‍රධාන ස්වරූප පහක් යටතේ හඳුනාගත හැකිය.

1. බල රහිත වීම (Power lessness)
   එනම් තම වුවමනාවන් ඉටු කරගැනීම තම උත්සාහය තුළින් ඉටු කරගත නොහැකි යන පරාජිතභාවයයි.

2. අර්ථ රහිත වීම (Meaning lessness)
   එනම් විවිධ සමාජ අවස්ථාවන්හි පුද්ගල අවබෝධයෙන් යුතුව ඒ හා සම්බන්ධ වන්නේ ද නැද්ද යන්න.
3. ධර්මතා රහිත බව (Norm lessness)
   සමාජයේ පිළිගත් ධර්මතා පද්ධතිය බඳවැටීම සාධාරණීකරණය වන තත්ත්වයක් පැවතීම.

4. හුදකලා වීම (Isolation)
   යම් පුද්ගලයෙක් තමන්ගේ අරමුණු හා විශ්වාසයන් ළගා කරගැනීම මෙන් ම ඒ ඔස්සේ තමන් වෙත ඇගයීමක් ගොඩනගා ගැනීමට නොහැකි වීම මත ඇතිවන මානසික කොන්වීම.

5. ආත්ම ගැටුම (Selfestrangement)
   පුද්ගලයා තමන් නිරත ක්‍රියාකාරකම් ඔස්සේ තම අරමුණු ඉටු කරගැනීමට අපොහොසත් වන විට ඇතිවන මානසික ව්‍යාකුලතාව.

මෙබඳු සමාජයීය ලක්‍ෂණයන් සහිත නූතන නවීකරණය වන සමාජයට සාහිත්‍යයේ අරමුණු කෙසේ බද්ධ කළ යුතු ද? මෙම සමාජයේ හර පද්ධතිය තුළින් උපන් අවශේෂ අංගෝපාංගයන් ඇසුරේ සිටින නූතන මිනිසාට සාහිත්‍යකරුවා ළං වන්නේ කෙසේ ද?

**නවීකරණය වන සමාජයේ සාහිත්‍යකරුවාගේ කාර්ය කුමක් ද?**

නූතන සාහිත්‍යකරුවන් අතර දැකිය හැකි සුලබ ප්‍රවණතාව වන්නේ ව්‍යවසනකාරී සමාජ අවස්ථාවන්, පීඩා පත් වූ ජන කොටස් මංකොල්ලකරුවන් ගණිකාවන් වැනි අපගාමිකයන් උද්දීපනය කොට ඔවුන් ඇසුරින් එක්තරා සමාජ සත්තාවක් මතු කිරීමයි. මෙය එඩ්වඩ් සෙයිද්, ගයත්‍රි චක්‍රවර්ති ස්පිවැක් වැනි අය විසින් හඳුන්වා දුන් පරිපීඩිතයන් පිළිබඳ අධ්‍යයන ප්‍රවේශයට සමාන ය. මෙම නියාමයට මූලික වී ඇත්තේ ඉතාලි ජාතික මාක්ස්වාදී චින්තකයෙකු වූ අන්තෝනියෝ ග්‍රැම්ස්චිගේ සංකල්පයකි. කෙසේ වුවද මෙලෙස පවතින සමාජයේ විසංවිධානාත්මක තත්ත්වය වෙනසක් නොකර ඒ හා බැඳුණු පුද්ගලයන්ගේ ජීවන රටාව නොවෙනස්ව පවතිද්දී ඔවුන්ගේ දුක්ඛදායක ජීවිතය පමණක් නිර්මාණයන් ලෙස ඉදිරිපත් කිරීම නූතනයේ කොතරම්දුරට ඵලදායී ද යන ගැටලුව ඇත. අවශ්‍ය වන්නේ වඩාත් යහපත් සමාජ පරිසරය තුළ සහනදායී සහජීවනශීලී මිනිසුන් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුතලය ඇති කිරීමයි. වේගයෙන් සමාජ සංචලතාවට බඳුන්වන නූතන සමාජය තුළ එම වෙනස්වීම් හමුවේ බිඳවැටෙන ජීවිත හා කඩා වැටෙන ආයතන යළි නගා සිටුවීමේ සාහිත්යික ක්‍රමපෝයන් නූතන ලේඛකයන්ගෙන් බලාපොරොත්තු වීම සාධාරණ ය.

දෙවනුව ඉහත දැක් වූ ලෙස පශ්චාත් යුධ සමයක සමාජ ආර්ථික සංස්කෘතික අංශයන්ගෙන් බිඳ වැටුණු සමාජය යළි නගා සිටුවීමේලා කළ යුතු පූර්ව අවශ්‍යතා අනුසාරයෙන් නව කතිකාවතක් ගොඩනැඟීමට සාහිත්‍යකරුවාට පුරෝගාමී විය හැකිය. බලය තත්ත්වය යන සාධක දෙක නූතන සමාජය හසුරුවන ආකාරය ඉතා සියුම්ව මෙහිදී තේරුම්ගත යුතුව ඇත.

තෙවනුව තරුණ ලේඛකයන් වඩ වඩාත් නූතන සමාජ ප්‍රශ්න වෙත සිය සියුම් අවධානය යොමු කිරීමේ වැදගත්කම අවධාරණය කළ යුතුය. සාහිත්‍යය සමාජ ප්‍රගතියේ ප්‍රබල අවියක් කරගත හැක්කේ එලෙස පෙරමුණගත් ප්‍රබුද්ධ ලේඛක පරපුරක පුරෝගාමීත්වයෙනි.

සිවු වෙනුව නවීකරණ ක්‍රියාවලිය හේතුවෙන් අපගෙන් දුරස්ථව යන ඇගයීම් පද්ධති යම් ප්‍රමාණයකට හෝ සමාජ දේහයේ රඳා පවත්වා ගැනීමට සාහිත්‍යකරුවාට යම් මෙහෙයක් කළ හැකිය. එසේ ම නවීකරණය හේතුවෙන් සොබා දහම හා මිනිසා අතර හෘදයංගම ගනුදෙනුවේ ඇති වී ඇති පරතරය අවම කිරීමට සාහිත්‍යකරුවකුට විශාල මෙහෙවරක් කිරීමට ද පුළුවන්කමක් ලැබේ.

මෙතෙක් වේලා අපගේ අවධානයට බොහෝ සේ බඳුන් වූයේ නවීකරණය පිළිබඳ න්‍යායික කරුණු රාශියකට ය. මෙතැන් සිට සාහිත්‍යික නිදර්ශන කිහිපයක් ඔස්සේ අප සාකච්ඡා කළ දේ තේරුම් ගැනීමට උත්සාහ කරමු. සමාජ නවීකරණ ක්‍රියාවලිය හා ඉන් අත්විය හැකි ප්‍රතිඵල ගැන සිංහල සාහිත්‍යකරුවන් සවිඥානිකව තිබේ ද? ඔවුන්ගේ නිර්මාණවල මේ සමාජ චල්‍යතා ප්‍රතිරාව දෙන්නේ ද? ඔවුන් මේ වෙනස්වීම් ග්‍රහණය කොට ඇත්තේ කුමන ස්වරූපයෙන් ද?

සැබැවින් ම නවීකරණයේ විවිධ පැතිකඩවල් සාහිත්‍යික මාර්ගයෙන් ඉදිරිපත් වූ අවස්ථා ගණනාවක් සිංහල සාහිත්‍යය ඔස්සේ අපට සපයා ගත හැකියි. මෙය එක් කුඩා නිදර්ශනයක් ඇසුරින් තේරුම් ගනිමු. රත්න ශ්‍රී විජේසිංහ විසින් රචනා කරනු ලදුව ජානක වික්‍රමසිංහ විසින් ගායනා කරන ලද පහත සඳහන් ගීතයට ඔබේ අවධානය යොමු කරන්න.

සඳ කිඳුරා මිය ගියා
ගමට එන්න නංගියේ
පසළොස්වක පෝය දා
අවසන් කටයුතු කළා

ගමේ නාඩගම් පොළේ
කිඳුරිය වී නුඹ එදා
ගැයූ ලිය ගී විකුණන්නට
කොලොම් තොටට ඉගිලුණා
කණ කෙකිනිය ගමට ඇවිත්
ඇඬුවා නුඹ ගැන කියා

වෙල් දෙණි ඕවිටි පුරා
තනිවම සීපද කියා
තනිව සිටිය කින්නරා
ළය දැදුරුව මිය ගියා
කණ කෙකිනිය අඬන්නෙ නෑ
ඇහේ කඳුළු නැති නිසා[9]

[9] රත්න ශ්‍රී විජේසිංහ (1998), *ඉරබටු තරුව*, කොළඹ: එස් ගොඩගේ සහෝදරයෝ, 89 පිටුව.

බැලූ බැල්මට සරල ගීතයක් ලෙස පෙනෙන මේ ගීතය පිළිබඳව විවිධ විචාර පැවතිය හැකියි. එහෙත් අප මෙම දේශනයෙන් අවධාරණය කරන වැදගත් සමාජීය කරුණක් මෙහි සංකේතාත්මකව සඟවා ඇති බව පෙන්වා දීමට පුළුවන. සාම්ප්‍රදායික සිංහල ජන සමාජයේ පතිව්‍රතාව බඳු සංකල්පයක් පොදු ජනයාට ඒත්තු ගන්වනු ලැබුවේ සඳ කිඳුරු නාටකය බඳු ගැමි නාට්‍යවලිනි. එම කිඳුරු නාට්‍යය ඇසුරු කරගත් පුවතකට සම්බන්ධ මේ ගීතය විශේෂිත ආකෘතියකින් රචනා වී ඇති ආකාරය හඳුනා ගත හැකියි. එනම් කිඳුරාගේ අභාවය දන්වා කිඳුරියට ලියන ලිපියක ආකෘතියකින් මේ ගීතය රචිතයි. මීට දශක කිහිපයකට පෙර නවීකරණයේ අරුණලු මෙරට ගම් දනව් මත පතිතවීමට පෙර  මෙරට වැසියන්ට ම ආවේණික ජන නාටක, ජන කලා, ජන සාහිත්‍ය සම්ප්‍රදායන් හා ඇගයීම් පද්ධති පැවතිණ. නවීකරණ ක්‍රියාවලියෙන් ඒ සියල්ල බලාපොරොත්තු නොවූ දෙදරුම් කැමකට ලක්විය. තාක්ෂණික යන්ත්‍රෝපකරණ ඈත පිටිසර ගම් දනව් පවා ආක්‍රමණය කළ අතර එහි දී ජන කලාකරුවන්ට ස්වකීය කලා කටයුතු තවදුරටත් පවත්වා ගැනීමේ හා එම සාහිත්‍ය ජන කලා නිර්මාණවල සමකාලීන උපයෝගීතාව  පිළිබඳ ගැටලු පැන නැඟිණ. රූපවාහිනිය, දූරකථනය, පරිගණක අන්තර්ජාල ආදී මෙවලම් සමාජ පාලන බලවේග බවට පත්වන විට ජන කවිය, ජන කථාව, ජන නාටකය, අත්කම් ආදී ජන කලා එක්කෝ නවීකරණය හමුවේ අභාවයට පත් වන්නට විය. නැත්නම් නවීකරණයට ඔබින අන්දමට ඒවා යාවත්කාලීන කිරීමට සිදු විය. මේ ගීතයේ එන කිඳුරිය එදා සාම්ප්‍රදායික සමාජයේ පුරපසළොස්වක පෝය දා ගමේ නාඩගම් පොළේ රංගනය කොට සමාජ සම්මත ඇගයීමක් ගම් වැසියන් අතර තහවුරු කළාය. ඒ රංගනය හුදෙක් පින උදෙසා හෝ සතුට උදෙසා ස්වේච්ඡාවෙන් කළ දෙයක් වූ අතර නවීකරණය වූ සමාජයක මෙබඳු රංගනයක් විශාල ආර්ථික උල්පතකි. කලාවට සහජ දක්ෂතා පැවැති ඈ නගරය කරා තල්ලු කෙරුණේ නවීකරණ ක්‍රියාවලිය මගිනි. දැන් ඇය එදා කිඳුරු නාටකයේ ගැයූ ලිය ගී මුදලට විකුණමින් අර්ථපතිනියක වී සිටියි. වර්තමානයේ ඇයගේ කලාව පදනම් වන්නේ තනිකර ම ධනය යන කාරණය මත ය. ගමේ පතිවත වෙනුවෙන් පෙනී සිටි පරමාදර්ශී චරිතයක් වුවත් නගරයේ දී ඇයට වඩා වැදගත් වන්නේ තම පතිවතට වඩා වැඩි වැඩියෙන් ධනය ඉපයීමයි. මේ නිසා ඇය පිළිබඳ ගමට හැමට විටම ඉගිළ ආවේ අසුබ ආරංචි පමණකි. මේ අතර තනිව හුදෙකලාවේ සිටි කිසිවෙකුගේ හව්හරණක් නොවූ ගමේ උන් කිඳුරා ළය පැළී මිය යයි. මේ ගීතය කිඳුරාගේ අභාවය කිඳුරියට ලියා දන්වන ලියමන යි.

සැබැවින් ම මෙහි මිය ගියේ කිඳුරා නොවේ. නවීකරණ ක්‍රියාවලිය හමුවේ කිසිවෙකුගේ හව්හරණට ලක් නොවූ සාම්ප්‍රදායික ඇගයීම් පද්ධතිය යි. නැතහොත් ජන කලා, ජන සාහිත්‍යය ආදියයි. ජීවත්ව සිටින කිඳුරිය එම ජන සාහිත්‍ය කලා ආදියෙහි නවීකෘත ස්වරූපය යි. සාහිත්‍ය කලාවක් පැවතීමට නම් වෙනස් වන සමාජ ක්‍රමයන් අනුව නැතහොත් චල්‍යතා හා ඇගයීම් අනුව එය හැඩගැසිය යුතු බවට තර්කයක් නැඟිය හැකි වුවත් නවීකරණය වූ කලාවේ උපයෝගීතාව සාම්ප්‍රදායික කලාවේ උපයෝගීතාවට වඩා සපුරා වෙනස් එකක් බව සඳහන් කරනු වටී. ඒ අනුව මේ ගීතය සමාජ නවීකරණය නිසා

දේශජ සාහිත්‍ය කලා ආදියට එල්ල වී ඇති දුර්දශාව සංකේතාත්මකව නිරූපණය කරන්නක් ලෙස සඳහන් කළ හැකියි.

නවීකරණ ක්‍රියාවලියත් සමග අපගෙන් සෑහෙන දුරස්ථව ගොස් ඇති දෙයක් නම් සොබා දහම පිළිබඳ සංවේදීතාවයි. මිනිසා සොබා දහමට එරෙහිව කටයුතු කිරීමේ අනිෂ්ට ප්‍රතිපල ඇස් පනාපිට අත් දකිමින් සිටින යුගයක් ලෙස මේ යුගය හඳුන්වා දිය හැකියි. සාම්ප්‍රදායික සමාජයේ සමාජ හරයන් සියල්ල ම පාහේ ගොනු වී පැවතියේ සොබා දහමට එකග අන්දමට යි. එසේ වුවත් නූතන යාන්ත්‍රික යුගයේ සොබා දහමේ සියල්ලට ම මූල්‍යමය වටිනාකමක් හිමිව ඇත. රතු ඉන්දියානු නායක සියැටල් ප්‍රකාශ කළ අන්දමට සොබා දහමේ සුන්දර දේවලට අපට අගයක් ලබාදිය හැකි ද? සොබා දහමේ පමණක් නොව මිනිසෙකු සතුව පවත්නා මානුෂීයත්වයක් අපට මිල කළ හැකි ද? මනුස්සකම මිල කරන්නට යෑමේ දී ගැටුම් හට ගනියි. මෙහි දී අපට නිරායාසයෙන් සිහිපත් වන්නේ වන්නියේ ආදායම් පාලකවරයෙකු ලෙස කටයුතු කරමින් නිර්ව්‍යාජ අත්දැකීමෙන් සිංහල කවිය පෝෂණය කළ විමලරතන කුමාරගමයන් මුහුණ දුන් සංවේදී අත්දැකීමකි. *'ආගන්තුක සත්කාරය'* නමින් 1945 දී රචිත මේ පද්‍ය පන්තිය නමින් පමණක් නොව මිනිසත් බවින් ද සුන්දර වූ සුන්දරහාමි නම් පුද්ගලයෙකුගේ ආගන්තුක සත්කාරය ගැන කියන්නකි.

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන නිවසේ තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස් පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත්කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළගුණ සැලකිය යුත්තේ
දුන් සත පණහවත් ඔහු නෑ පිළිගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැතී
හිතවත්කමින් සැලකුම යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහි වී මගේ කම්මුල රතු පැහැය ගතී[10]

[10] *විමලරත්න කුමාරගමගේ එකතු කළ කවි*, සුසිල් සිරිවර්ධන, එස් විජේසූරිය (සංස්), කොළඹ එක්ස්ප්‍රෝ ග්‍රැපික් 71-72 පිටු.

මෙහි රචක කවියා ස්වකීය කෘතවේදීත්වය පෙන්වීමට යොදා ගන්නේ මුදල යි. ගැමියා එය නොපිළිගත් නිසා කවියාට මුහුණ පාන්නට සිදු වූ අපහසුව මෙහි නිර්ව්‍යාජව පැවසේ. කොතරම් දුෂ්කරතා මත දිවි ගෙවන ජනකායක් සිටිය ද  ආගනතුක සත්කාර ආදී හරයන් අපේ සමාජයේ අතිමූලික දේ ලෙස සැලකිණ. එහෙත් දැන් සියලු ම දේ ම පාහේ මුදල මත නිර්ණය වන සමාජයක් නිර්මාණය වී තිබේ.

අපි යළිත් සොබා දහම හා සම්බන්ධ කාරණයට එළඹෙමු. සොබා දහම ආස්වාදය කිරීම මිනිසාගෙන් දූරස්ථවීමට නවීකරණය අනිවාර්යයෙන් ම හේතු වී තිබේ. මහගම සේකර 1963 වසරේ දී තරම් ඈත දී පළ කළ '*හෙට ඉරක් පායයි*' පද්‍ය සංග්‍රහයේ පද්‍යයක් මෙහි දී සිහිපත් වේ.

කලාතුරෙන් දවසක ගමට යන විට
අපේ පරණ ඉස්කෝලය පෙනෙයි මට
සිංහල උළු සෙවිලි කළ ඒ වහල යට
සඟවා තිබේ මගෙ ජීවිතයෙහි සතුට

ඈත අහස දෙස නිකමට දෑස හෙළා
කොලුවෙක් සිටී පංතිය කෙළවරට වෙලා

ගහකොළ කියන දෙය ඇසෙනා මුත් කනට
ගුරුතුමා කියන දෙය නෑසෙයි ඔහුට
ඔහුගේ මුහුණ හොඳ හැටි නොපෙනුණත් මට
ඒ ඉන්නේ මා යැයි සැක සිතෙයි මට[11]

පන්තියේ කෙළවරට වී ඈත අහස දෙස බලමින් ගස් කොළන්වල කටහඬට සවන් දෙමින් සිටි මේ දරුවා අද අපට සොයා ගත හැකිද? සැබැවින් ම නොහැකියි. උදෑසන පටන් අනවරත තරගකාරී ප්‍රවාහයකට ඇද දැමූ, මුළු දවස ම යාන්ත්‍රික අන්දමට ක්‍රියාත්මක වන දරු පරපුරක් අද අප හමුවේ සිටියි. පාසලෙත් උපකාරී පන්තිවලත් කෘත්‍රිම අන්දමට නිෂ්පාදනය කෙරෙන මේ අනාගත පරම්පරාවට සොබා දහම ආස්වාදය කිරීමට අවස්ථාවක් නොලැබේ. ආසියාවේ විශිෂ්ටතම කවියෙකු වන රවීන්ද්‍රනාත් තාගෝර් කිවිඳු නොබෙල් ත්‍යාගය පිළිගැනීමේ දී කළ කථාවේ මෙසේ දැක්වේ.

[11] මහගම සේකර (2005 මුද්‍රණය), *හෙට ඉරක් පායයි*, කොළඹ; එස් ගොඩගේ, 19 පිටුව.

''මා ළාබාල අවධියේ මගේ ජීවිතයෙහි ක්‍රියාකාරකම් වර්ධනය වූ ආකාරය මට මතක තිබේ. මට වයස අවුරුදු විසි පහේ දී පමණ ගංගා නම් නදිය අසබඩ අප්‍රකට බෙංගාලි ගමක බෝට්ටු මඩුවක හැකිතරම් හුදෙකලාවේ වෙලී තනියම ජීවත් වන්නට මම පුරුදු වුණෙමි. සරත් ඍතුවේ හිමාල වන පියසේ තටාකවලින් පැමිණෙන වන තාරාවන් මගේ එක ම මිත්‍රයන් වූ අතර, ඒ හුදෙකලාවේ දී ඉහළ අවකාශයේ මධුව හා මුසුවීමෙන් මෙන් උතුරා යන හිරු කිරණයෙන් මා මත් වූ ආකාරයක් දැක ගත හැකිවිය. එසේ ම නදියේ මුහුමුහුව මට කතාකරන්නට පුරුදුව සිටි අර එය මට සොබා දහමේ රහස් පවසන්නට ද විය''[12].

අපේ රටේ ප්‍රවීණ සාහිත්‍යධරයන්ගේ ජීවිත ගෙන බැලූ විට ඔවුන් ද කුඩා අවධියේ තමන් ජීවත් වූ ප්‍රදේශවල පරිසරයෙන් උගත් දේ බොහෝ බව පෙනී යයි. උදාහරණ ලෙස මාර්ටින් වික්‍රමසිංහ, කේ. ජයතිලක, ගුණදාස අමරසේකර, මහගම සේකර, සයිමන් නවගත්තේගම වැනි රචකයින්ගේ නිර්මාණවල ප්‍රභාසම්පන්නභාවයට එක් වැදගත් හේතුවක් වී ඇත්තේ ඔවුන් තමන් හැදී වැඩුණ ගම් පියස්වලින් ලැබූ අත්දැකීම් ය. පොතින් පතින් ලැබීමට අසීරු සංවේදී දැනුමක් පරිසරයේ ජීවත්වීමෙන් ලද හැකි බව මේ රචකයින්ගේ නිර්මාණ අපට කියා දෙයි. අප ඉදිරියේ ඇති විශාල අභියෝගයක් වන්නේ නවීකරණය වූ නාගරික සංස්කෘතියක බිහිවන ලේඛකයින්ට මෙබඳු පාරිසරික අත්දැකීම් උකහා ගැනීමට ඇති අවස්ථා විරල වීමයි. ඔවුන්ට සාහිත්‍ය නිරමාණ ලෙස පහසුවෙන් ම ප්‍රතිනිර්මාණය කළ හැක්කේ ඔවුන් ජීවත් වන යාන්ත්‍රික සමාජ වටපිටාවේ තමාට සමීප අත්දැකීම් පමණකි. සොබා දහම කෙරෙහි සංවේදී අත්දැකීම් රහිතව ඒ ගැන විවිධ නිර්මාණ කළ ද ඒවායේ ව්‍යාජත්වය මතුවී පෙනෙන බැවින් එබඳු නිර්මාණ ටික කලකින් පාඨකයාගේ ගිලිහී යෑම අනිවාර්යය දෙයක් වේ. අපි යළිත් තාගෝර්තුමා වෙත හැරෙමු. ඔහු ඔහුගේ ජීවිතය ගැන 1924 දී චීනයේ කළ කථාවක මෙසේ එයි.

''ළදරු වියෙහි සිට මම සංවේදී තැනත්තෙක් වීමි. ඒ සංවේදීතාව මගේ මනස කිතිකවමින් මා වටා වූ සෞන්දර්යය හා මනුෂ්‍ය ලෝකය පිළිබඳ මා අවධියෙන් තැබීමට සමත් විය. අපේ නිවසට යාව කුඩා ගෙවුයනක් විය. එය මට සුරාංගනා ලෝකයක් වූයේ ය. සුන්දරත්වයේ ප්‍රාතිහාර්යය එහි සැමදාම සිදුවිණ. සැම දිනකම අලුයම් හෝරාවේ මා යහනින් නැගී වහා දිව ගියේ ගෙවුයන සීමා කරමින් එක් පෙළට සිටි පොල් ගස්වල අතු සෙලවෙන අතු පතරින්, මඳ රත් පැහැති අරුණලු කිරණ වැටී එනු බැලීමට ය. උදා පවනේ පළමු කම්පනය විඳගත් පිනි බිඳු රැඳි තණකොළ දිලිසෙයි. අහස මා හා පෞද්ගලික සුහදතාවක් පවත්වන්නා සේ ය. මගේ මුළු හදවත ම මුළු ගත ම ඒ නිහඬ හෝරාවන්හි උතුරා ගිය ආලෝකය හා සාමය, එක උගුරට උරා ගන්නා සේ ය. එකම උදෑසනක වත් මේ අසිරිය නොවිඳ සිටීමට

[12] Rabindranath Tagore (2003) *Gitanjali*, New Delhi: UBS Publishers. 292p

මට නොහැකි විය. මසුරෙකුට ලැබෙන රන්වලට වඩා මේ සෑම උදෑසනක් ම මට වටනේ ය''[13]

නොබෙල් ත්‍යාගලාභී සාහිත්‍යකරුවෙකු ස්වකීය නිර්මාණ සඳහා සොබා දහමෙන් අනුප්‍රාණය ලද අන්දම මේ හැම ප්‍රකාශයකින් ම පාහේ හෙළිවේ. අද අපේ කාලයේ නිර්මාණ රචකයෙකුට මෙවන් අත්දැකීමක් ලැබීමට අවස්ථාවක් උදාවේ ද? නවීකරණය මගින් මිනිසා සොබා දහමින් ටිකෙන් ටික දුරස්ථ කර තිබේ. එයින් කිසිසේත් ම හිතකර ප්‍රතිඵල අපේක්ෂා කළ හැකි නොවේ.

සියලු යන්ත්‍රෝපකරණ භාවිතය හැර දමා යළිත් සරල ප්‍රාකෘතික ජීවිත කරා යා යුතු බවක් ද මින් අදහස් නොකෙරේ. සාහිත්‍යකරුවා මූලික වශයෙන් අප ජීවත් වන වේගවත් පරිභෝජනවාදී සමාජයත් සංස්කෘතියත් වටහා ගත යුතුවේ. මෙයින් ඇති කරන මහා කම්පනයත් බලාපොරොත්තු කඩවීමෙන් ලබන උද්වේගයත් ඔහු නිවැරැදිව ග්‍රහණය කරගත යුතුයි. අප කැමැති වුවත් අකමැති වුවත් නූතන සමාජ ආර්ථික වටපිටාවෙන් මිදීමට අපට හැකියාවක් නැත. එහෙත් වඩා වැදගත් වන්නේ සංවාදයක් ඇති කිරීමයි. කතිකා ගොඩ නැංවීමයි. එය ඉතා පහසුවෙන් හා හෘදයංගම ලෙස කළ හැක්කේ සාහිත්‍යකරුවාට පමණකි. ශාස්ත්‍රීය පර්යේෂණ මගින් පැමිණෙන රළු පරළු නිගමනවලට වඩා මිනිසාට මෘදු මොළොක් ලෙස, සිනිඳු ලෙස කරුණු අවබෝධ කරවීමේ හැකියාවක් සාහිත්‍යයට ඇත. නවීකරණය හමුවේ බිඳ වැටෙන මානව ධර්ම, ගිලිහී යන සමාජ හරයන් පිළිබඳ අප නිර්මාණාත්මක මෙවලම් භාවිතයෙන් කතිකාවක් ගොඩ නගන්නේ නම් එය සමාජය සුබවාදී දිශාවකට හරවන හැරවුම් ලක්ෂයක් වනු ඇත.

මේ ගිලිහී යන හර පද්ධති යම් ප්‍රමාණයකට හෝ සමාජයේ රඳවා ගැනීමට සාහිත්‍යකරුවෙකුට කළ හැක්කේ කුමක් ද? මෙය නිර්මාණයක් ඇසුරින් විමසා බලමු. අද නවීකරණයේ හිණි පෙත්තට නැඟී ඇති සමාජයේ දෙමාපියන්ට මුහුණ දීමට සිදුව ඇති ඛේදවාචකයන් අපට නිරන්තරයෙන් අසන්නට දකින්නට හැකිවේ. සාම්ප්‍රදායික විස්තෘත පවුල් ක්‍රමයේ දෙමාපියන්ට මහලු වයසේ දී ස්වාභාවික රක්ෂණයක් විය. එනම් ඔවුන්ගේ දරු මුනුපුරු පරම්පරා විසින් දෙමාපියන් රකිනු ලැබීමයි. පරම්පරා පරතරයක් ඇති වීමට අපගේ සංස්කෘතියේ කිසිදු ඉඩක් පැවතියේ නැත. එහෙත් නූතන න්‍යෂ්ටික පවුල් ක්‍රමය තුළ මේ පරතරය නැවත සමීප කළ නොහැකි තරමට දුරස්ථ වී තිබේ. නූතන යුගය වන විට දරුවන්ගෙන් නඩත්තුව ඉල්ලන දෙමාපියන් ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. පවුල් ඒකකය කැඩී විසිරී යෑම ඕනෑම සමාජයක් දෙදරා යාමේ මුල් පියවරයි. පවුල බිඳ වැටීම ඉක්මන් කරන සාධක අද සමාජයේ හොඳින් ක්‍රියාත්මක වේ. ඉන් එකක් නම් පවුලට ජීවය සැපයෙනුයේ ගෙවල් වතුපිටි යාන වාහන රැකියා ආදිය පමණය යන මිත්‍යාව අද වන විට සමාජයේ තහවුරුව පැවතීමයි. පවුල් ජීවත් කරවන චිත්තවේගී පෝෂණය දෙමාපිය දරුවන් අතර ඇති බැඳීම යන කරුණ අද වන විට යටපත්ව ඇත. සදර්ලන්ඩ් නමැති මානව විද්‍යාඥයා වරක් ප්‍රකාශ කළේ බිඳුණු පවුලක දෙමාපියන්ට දරුවන් හෝ දරුවනට

[13] *ගීතාංජලී* (1998 මුද්‍රණය), කුසුම් දිසානායක (පරි), කොළඹ එස්. ගොඩගේ xxxv-xxxvi පිටු.

දෙමාපියන් හෝ වැදගත් නොවන බවයි. ඒ තැන ගැනීමට වෙන දේවල් ඇති බව ඔහු පෙන්වා දී තිබේ.

සාර්ථක පවුලක් උදෙසා දරුවන් සඳහා දෙමාපියන් විසින් කළ යුතු කාර්යයන් ගණනාවක් ද වේ. පළමුව දෙමාපියන් දරුවන්ගේ ආශාවන් හා ළැදියාවන් තේරුම් ගැනීම වැදගත් ය. එහෙත් තමන්ගේ වුවමනා එපාකම්වලට අනුරූප වන අන්දමට දරුවන් හැඩගැස්වීමට අද දෙමාපියන් කටයුතු කරන බව නොරහසකි. තරුණ සිසුන් උපකාරක පන්තිවලට ගොස් පැමිණෙන තුරු කුසගින්නේ ඒ අසල සිටගෙන සිටින මවුවරුන් අපට කොතෙකුත් දැක ගත හැකියි. මෙසේ ප්‍රමාණය ඉක්මවා ආරක්ෂාව රැකවරණය දීමේ භයානක පැත්තක් ද වේ. එනම් යම් වෙලාවක අදාළ දරුවන් තනිකිරීමට සිදු වූ විටක ඔවුන් විශාල අනාරක්ෂිත අවදානමකට මුහුණ පෑමයි. එබඳු මොහොතක දරුවා කුමන දිශාවකට යොමුවේදැයි කිසිවෙකුට පැවසිය නොහැකි අතර ජීවිත විශාල වශයෙන් අවාසනාවන්ත තත්ත්වයකට පත්කර ගත් අය මෙබඳු පසුබිමක දරුවන් බව පෙන්වා දීමට හැකියි.

අපේ සමාජය මුහුණ දෙමින් පවතින ප්‍රධාන ප්‍රශ්නයක් ලෙස වැඩිහිටි ජනගහනය ඉහළ යාම හඳුන්වා දිය හැකියි. මෙබඳු පසුබිමක වැඩිහිටියන්ගේ ජීවිතය සුවබර කිරීමට ප්‍රාමාණික දේ පවුල් සංස්ථාව තුළින් හෝ රජයක් වශයෙන් හෝ සැලසීමට අපොහොසත් වී ඇති ආකාරයක් හඳුනා ගත හැකියි. දරුවන් දෙමාපියන්ට සැලකීම නිරපේක්ෂ සාරධර්මයකි. ඒ ඒ සංස්කෘතීන් විසින් එක එක ආකාරයට එය අනුමත කර තිබුණත් එහි පොදු හරය සදාතනික සත්‍යයකි. කෙසේ වුවත් යන්ත්‍ර බවට පත් වී ඇති නූතන මිනිසා කාලය අවකාශය හා සිය ඕනෑකම් සියල්ලම සමග පොර බදන තත්ත්වයට පත්ව ඇත. එම තරගයේ දී ඔවුන්ට ඇතැම් විට දෙමාපියන් පිළිබඳ සිතීමට අවකාශයක් නොමැත. ඒ වෙනුවට ප්‍රමුඛතාව දිය යුතු වෙනත් දෑ ගණනාවක් ඔවුන් ඉදිරියේ ගොඩ ගැසී ඇත. එදා වැඩිහිටි නිවාස හෝ මහලු නිවාස යනුවෙන් හැඳින් වූ නිවාසවලට සම්බන්ධ කර අද විශ්‍රාමික නිවාස යනුවෙන් දෙයක් නිර්මාණය වී තිබේ. බොහෝ විට මේවායේ දැක ගත හැක්කේ සිවිල් නිලධාරීන් හා උපාධිධාරී පිරිස් ය. මේ පිරිස් තමන්ගේ විශාමික වැටුප මේ ආයතනවලට හරවා ගෙදර නොගොස් මේ ආයතනවල ම රැඳී සිටිති. ඔව්හු නිරනතරයෙන් ම තමන්ගේ උගත් දරුවන් ගැන කනස්සල්ලෙන් කතා කරති. මේ කතා බහේ දී සමාජ විද්‍යාඥයෙකුට පෙනී යන කරුණක් වන්නේ දරුවන් ඉහළට යන විට ඔවුන් තම දෙමව්පියන්ගෙන් ඈත්ව යන බවයි. එහෙත් එසේ වීමට හේතු කිසිවෙකු සොයා නැත.

රුපියල් දහසක් අතට දී මවක අතර මං කර පළා යන පුතෙකු පිළිබඳ කවි පෙළක් 2010 වර්ෂයේ විශිෂ්ටතම කාව්‍ය සංග්‍රහය ලෙස රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ '*හිරුත් හිම පියල්ලක*' කෘතියේ දක්නට ලැබේ. '*ගස යට නතර වුණු අම්මාගෙන්*' යනු මේ පැදි පෙළේ මාතෘකාවයි.

පාන්දර පුතා මට කියූ විදියට

බොහෝ දුර ඇවිත් නැඟ පුතුගෙ රථයට

නතර කර පසුව නගරෙක ගසක් යට
හුස්ම හිර වුණත් පෙන්නුවෙ නෑ පිටට

පුත නුඹ වඩාගෙන මම ඉස්සර දිනෙක
ගමනක මහන්සිය හැර ගන්නට රැයෙක
නැවතුණු මෙතැන මේ ගස හොඳ හැටි මතක
මෙතැනට මාව ගෙන ඒම ම පුදුමයෙක

ඉතින් පුතේ නුඹ බිහි වූ දිනේ සිට
ඇතින්නියකගේ හදකින් ලද පෙමට
ගිහින් එමි කියාවත් නොකිය යන විට
ඇහෙන් ගලා හැළුණා හදවත බිමට

අතේ තියපු රුපියල් දාහ හරි බර
හිතේ සවිය ගෙන ඉමි දැස් ගුළිකර
රතේ පදිද්දිත් කලබලයකින් තොර
පුතේ පරිස්සම් වී පලයන් ගෙදර[14]

මාතෘත්වයේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ අපගේ ආගමික සාහිත්‍යයෙත් ජන සාහිත්‍යයෙත් නොමඳව සඳහන් වී ඇත. මේ පද්‍යයේ එන මව තමාගේ දරුවාට අසීමිතව ආදරය කරන සැබෑ ම මවක වන අතර දරුවා දෙමව්පියන් මහ දවල් මහමග අතරමං කර යන සමාජ කෲරත්වයේ නියෝජනයක් ලෙස පෙනී සිටියි. තම දරුවා තමන්ට කොතරම් නොකටයුත්තක් කළ ද මව එය සලකන්නේ නැත. *සද්ධර්මරත්නාවලියෙහි* කතුවරයා ප්‍රකාශ කළ පරිදි 'දෙමාපියෝ නම් දරුවන්ගේ කවර වරදක් ඇතත් මොළොක් අදහස් ඇත්තෝ ය' යන කියමන මෙහි දී සිහිපත් වෙයි. මේ පැදිය මාතෘත්වයේ උත්තරීතර බවත් නවීකරණය විසින් නොමග යැවූ ප්‍රතිමාන හීන නූතන දරු පරපුරේ ක්‍රියාකලාපයත් එක ම චිත්‍රයකින් නිරූපණය කරන්නකි. මෙය කියවූ, කොළඹ රැකියාවක් කරමින් උන් තරුණයෙකු තම මව බැලීමට ගමේ යැමට දිනයක් යොදා ගත් සිදුවීමක් මේ අලුත් ම පරම්පරාවේ කවියා ස්වකීය කෘතියේ අලුත් මුද්‍රණයේ සඳහන් කොට තිබේ. නවීකරණය හමුවේ ශීඝ්‍රයෙන් මානව ධර්ම ගරා වැටෙන සමාජයක සාහිත්‍යකරුවාට කළ හැකි යමක් පිළිබඳ ඉඟියක් මෙයින් අපට හඳුනා ගත හැකියි. අදාළ

[14] මහින්ද ප්‍රසාද් මස්ඉඹුල (2012) *හිරුත් හිම පියල්ලක*, සත්ථව ප්‍රකාශන, 27 පිටුව

පුද්ගලයා ඉහත කී පැදි පෙළ කියවා ස්වකීය මව බැලීමට යෑමට තරම් උත්සුක වූයේ මේ නිර්මාණය ඔහු තුළ කිසියම් කම්පනයක් ඇති කරන ලද්දක් වීම නිසා ය. හුදෙක් රසවින්දනයට පමණක් සීමා වූ, මහ පොළොවේ පය ගසන ජීවිත හා කිසිදු සබඳතාවක් නැති සාහිත්‍යයකට වඩා අප ජීවත්ව සිටින සමාජය, අප අවට වටපිටාව ගැන කතා කරන සාහිත්‍යයක් වැදගත් ය. එහි දී මේ දුගද හමන කුණපයක් බඳු සමාජය ශීලාචාර කිරීමට, සුබවාදී කිරීමට නිර්මාණකරුවන්ගේ කිසියම් දායකත්වයක් ලැබේ නම් එය කාලීන දෙයක් ලෙස සඳහන් කළ හැකියි.

මේ දේශනයේ කිහිප විටක තාගෝර් කිවිඳු ගැන ප්‍රකාශ වූ බැවින් මෙහි සමාප්තිය පිණිසත් ඔහුගේ ම පැදියක් උපුටා ගනිමි. එතුමන් විසින් රචිත *Stray Birds (මංමුළාව යන කුරුල්ලෝ)* නම් කුඩා පැදි කෘතියක් ඇත. එහි එක් කවියක් පරිවර්තනය කළ විට මෙසේ සිටියි.

කවුරුන්ද ඉන්නේ මෙහේ
භාර ගන්නට මගේ රාජකාරිය
ඇසුවේය බැස යන හිරු

මට හැකි දෙයක්
මම කරන්නම් මගේ හිමියෙනි
කීවේය මැටි පහන[15]

කුඩා පහන් එළි සිය ගණනකින් විශාල ආලෝක ප්‍රවාහයක් නිර්මාණය කළ හැකි බව අපි දනිමු. ඒ ආලෝකය සමාජය වසා පැතිරෙන යම් ගනඳුරක් වේද ඒ අඳුර පලවා හරින්නට හේතුවක් වනු ඇති බව මගේ විශ්වාසය යි.

---

[15] “Who is there to take up my duties?” asked the setting sun.
“I shall do what I can, my master”, said the earthen lamp

*Stray Bird, Lover’s Gift & Crossing*, New Delhi, Shrijee’s Book International, 38p.